# දත්ත සහ තොරතුරු

සැකසුම :-
සුරංගි දේවකලුආරච්චි
ගුරු උපදේශක (තොරතුරු තාක්ෂණ)
පළාත් පරිගණක සම්පත් මධ්‍යස්ථානය,
අනුරාධපුර

Education NCP - www.edncp.lk

- දත්ත හා තොරතුරු යනු එකිනෙකට වෙනස් වූ සංකල්ප දෙකකි.

දත්ත → තොරතුරු

  - දත්ත යනු අමු ද්‍රව්‍යයන්ය.
  - මෙම දත්ත සැකසීමෙන් තොරතුරු ලබා ගනී.

Education NCP - www.edncp.lk

| දත්ත | ක්‍රියාවලිය | තොරතුරු |
|---|---|---|
| 2+3 | 2+3=5 | 5 |
| ආදානය | සැකසීම | ප්‍රතිදානය |

ආදානය - දත්ත ලබා දීම.

සැකසීම - දත්ත සකස් කිරීම.

ප්‍රතිදානය - තොරතුරු ලබා ගැනීම.


Education NCP - www.edncp.lk

# දත්ත යනු මොනවාද?

- දත්ත යනු සකස් කිරීම සඳහා පරිගණකය වෙත ඇතුලත් කරනු ලබන අමු ද්‍රව්‍යයන්ය.
- සකස් නොකරන ලද අමු ද්‍රව්‍ය ලෙස පවතින අංක, අක්ෂර , වචන හා වාක්‍යයන්ද, වර්ණ හා රූප වැනි ඕනෑම ද්‍රව්‍යක් දත්තයක් විය හැක.

Education NCP - www.edncp.lk

- වෙන් වෙන් වශයෙන් ගත් විට තොරතුරක් ලබා දීමට අසමත් රූප, වචන, ඉලක්කම්, සලකුණු හෝ ශබ්ද දත්ත ලෙස හැඳින්වේ.




Education NCP - www.edncp.lk

# තොරතුරු යනු මොනවාද?


- තොරතුරු යනු අර්ථවත් ලෙස සකසා සංවිධානය කල දත්ත වේ.
- දත්ත සකස් කිරීමෙන් තොරතුරු ලබා ගත හැකි වේ.

• තොරතුරු තීරණ ගැනීම සඳහා උපකාරීවේ.

Education NCP - www.edncp.lk

- කිසියම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා තේරුමක් ඇති ප්‍රයෝජනවත් ලෙස සකසන ලද දත්ත තොරතුරු වේ

ජාතික හැඳුනුම්පතක ඇති අංකය නිරීක්ෂණය කරන්න. එය දුටු විට අපට ඒවා අංක පමණක් බව වැටහුණත්, ඒවා හොඳින් නිරීක්ෂණය කළ විට එම අංකය ඔස්සේ අපට තොරතුරු ලබා ගැනීමට හැකි බව පෙනී යයි. එනම්, මෙහි දී එක් එක් සංඛ්‍යා වෙන ම ගත් කල අර්ථයක් නොමැති අතර සම්පූර්ණ අංකයෙහි අංකවල ඇති ස්ථානය ගත් කල තොරතුරක් ලබා ගත හැකි ය.





0 - 4 දක්වා අංක මගින් පුරුෂයෙකුගේ හැඳුනුම්පතක් බවත් දැක්වේ.
5 - 9 දක්වා අංක මගින් ස්ත්‍රියකගේ හැඳුනුම්පතක් බවත් දැක්වේ.

Education NCP - www.edncp.lk

| දත්ත | තොරතුරු |
|---|---|
| අමු ද්‍රව්‍යන්ය . | සැකසුම් ප්‍රතිපලවේ. |
| අර්ථයක් නොමැත . | අර්ථවත්ය. |
| සකස් නොකරන ලද. | සකස් කරන ලද. |
| සංවිධානය නොකරන ලද. | සංවිධානය කරන ලද. |
| ආදානයන්ය. | ප්‍රතිදානය. |

Education NCP - www.edncp.lk

# තොරතුරුවල සුවිශේෂිතා

| ගුණාත්මක තොරතුරක ලක්ෂණ | නිදසුන |
|---|---|
| a) අදාළ බව  | පුද්ගලයෙකුගේ උසස් ම අධ්‍යාපන සුදුසුකම් දැක්වීම අවශ්‍ය අවස්ථාවක පළමු වසරේ සිට ම ලැබූ අධ්‍යාපන විස්තර ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. |
| b) අංග සම්පූර්ණ බව  | රටක ඒක පුද්ගල ආදායම ගණනය කිරීම සඳහා සුළු පිරිසකගේ තොරතුරු පමණක් ලබා ගැනීම ප්‍රමාණවත් නොවේ. අසම්පූර්ණ තොරතුරු වැරදි තීරණ ලබා දේ. |
| c) නිරවද්‍යතාව  | රෝගියෙකු පිළිබඳ වැරදි තොරතුරු වෛද්‍යවරයෙකුට ලබා දුන හොත් රෝගියාට අනතුරක් විය හැක. |
| d) කාලීන බව  | තොරතුරු සැම විට ම යාවත්කාලීන විය යුතුයි. අද දින ලබා ගන්නා කාලගුණ වාර්තා හෙට දිනයේ කාලගුණය තීරණය කිරීමට යෝග්‍ය නොවේ. |
| e) පිරිවැය අවම වීම   | ආයතනයක් ලාභ ඉපයීම් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් කිරීමට පෙර, රැස් කිරීමට බලාපොරොත්තු වන තොරතුරු වෙනුවෙන් අධික පිරිවැයක් දැරීමට සිදුවේ. මෙය ආයතනයට පාඩුවකි. |

Education NCP www.edncp.lk

# පසුගිය විභාග ප්‍රශ්න සහ පිළිතුරු

# 2007 – 2019

Education NCP - www.edncp.lk

# අ. පො.ස. (සා/පෙ) 2007 –1 පත්‍රය

- 1. පහත දැක්වෙන ඒවායින්, අමු දත්ත ලෙස සැලකෙන්නේ කුමක්ද?

1) පන්තියක ශිෂ්‍යයෙකු ලබා ගත් ලකුණු.
2) පන්තියක ශිෂ්‍යයින් ලබා ගත් ලකුණු අනුපිළිවෙලකට සකස් කල ලැයිස්තුව .
3) පන්තියක ශිෂ්‍යයින් ලබා ගත් උපරිම ලකුණු.
4) පන්තියක ශිෂ්‍යයින් ලබා ගත් සාමාන්‍ය ලකුණු .

Education NCP . www.edncp.lk

# අ. පො.ස. (සා/පෙ) 2008 –1 පත්‍රය

1) පහත සඳහන් ඒවා අතුරෙන් තොරතුරු ඇතුලත් නොවන්නේ කවර එකෙහිද?

1) කාලගුණ වාර්තාවක
2) කාලසටහනක
3) සුපිරි වෙළඳ සැලක ප්‍රදර්ශනය කෙරෙන මිල දර්ශනයක
4) ලේබල් නොකරන ලද ප්‍රස්ථාර සටහනක

Education NCP - www.edncp.lk

# අ. පො.ස. (සා/පෙ) 2009 -1 පත්‍රය

- 1. වෛද්‍යවරයෙකු විසින් පැය 5 ක් පුර උණ රෝගියකුගේ උෂ්ණත්වය අධීක්ෂණය කරනුයේ
  - A) පැයකට වරක් රෝගියාගේ නළලට අත තබා බැලිමෙන්ය.
  - B) පැයකට වරක් උණ තත්වය කෙසේදැයි රෝගියාගෙන් විමසිමෙන්ය.
  - C) පැයකට වරක් උෂ්නත්වමානයකින් කියවනු ලබන පාඨ අංක භාවිතයෙන් ප්‍රස්ථාර ඇදිමෙන්ය

වෛද්‍යවරයාට, රෝගීයාගේ උණ තත්වය පිලිබඳ තොරතුරක් ලබා ගත හැක්කේ ඉහත සඳහන් කවරකින්ද?

1. A මගින් පමණි
2. B මගින් පමණි
3. C මගින් පමණි.
4. A, B සහ C යන සියල්ලම

Education NCP - www.ednce.lk

# අ. පො.ස. (සා/පෙ) 2011 –1 පත්‍රය

1. පහත සඳහන් දෑ අතුරෙන් තොරතුරු සමග සංසන්දනය කිරීමේදී දත්ත ලෙස වර්ගීකරණය කල හැක්කේ කුමක්ද?

1) අනුරාධපුර නගරයේ සාමාන්‍ය මාසික උෂ්ණත්වය
2) පාසලක පිරිමි හා ගැහැණු සිසුන්ගේ ප්‍රතිශතය දැක්වෙන වට ප්‍රස්ථාරය
3) ගෘහස්ත දුරකථන අංකයක අවසන් සංඛ්‍යා සතර
4) ගණිතය සඳහා 10 වැනි ශ්‍රේණියේ සිසුන් ලබා ගත උපරිම ලකුණු

Education NCP - www.edncp.lk

# අ.පො.ස. (සා/පෙ) 2019 -1 පත්‍රය

5). දත්ත සැකසුම සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් කවරක්ද ?

1) මුදල් ආපසු ගැනීමෙන් පසු , බැංකු කරණ මෘදුකාංගයක් භාවිතයෙන් ගිනුමේ ශේෂය ගණනය කිරීම.

2) ගොනුවක් usb ධාවකයෙන් පරිගණකයේ දෘඩ තැටියට කොපි කිරීම

3) පුද්ගලික පරිගනකයට ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක් ස්ථාපනය කිරීම

4) සුපිරික්සකයක් භාවිතයෙන් ලිපියක් සුපිරික්සීම

Education NCP . www.edncp.lk

# පිළිතුරු

- අ. පො.ස. (සා/පෙ) 2007 –1 පත්‍රය
  - 1). පන්තියක ශිෂ්‍යයෙකු ලබා ගත් ලකුණු.
- අ. පො.ස. (සා/පෙ) 2008 –1 පත්‍රය
  - 4). ලේබල් නොකරන ලද ප්‍රස්ථාර සටහනක
- අ. පො.ස. (සා/පෙ) 2009 –1 පත්‍රය
  - 3). C මගින් පමණි
- අ. පො.ස. (සා/පෙ) 2011 –1 පත්‍රය
  - 3). ගෘහස්ත දුරකථන අංකයක අවසන් සංඛ්‍යා සතර
- අ.පො.ස. (සා/පෙ) 2019 –1 පත්‍රය

  1). මුදල් ආපසු ගැනීමෙන් පසු , බැංකු කරණ මෘදුකාංගයක් භාවිතයෙන් ගිනුමේ ශේෂය ගණනය කිරීම.

Education NCP - www.edncp.lk